# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2010 අංක 1 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2010 ජනවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 ජනවාරි මස 15 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2010 අංක 1 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2010 ජනවාරි මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 3/2007.

## 1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1981 අංක 43 දරන පනත මගින් ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කරනු ලැබූ හෙයින් ද : පූර්විකාව.

ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී එහි නාමය වෙනස් කිරීම සඳහා සහ එකී සංස්ථාවේ අරමුණු වඩාත් සක්‍රීය ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා ඉහත කී 1981 අංක 43 දරන පනතට ඇතැම් සංශෝධන ගෙන ඒමට යෝජනා සම්මත කර ඇති හෙයින් ද:

ඉහත කී යෝජනා සම්මතය බලාත්මක කිරීමේ කාර්යය සඳහා ඉහත කී පනත සංශෝධනය කරන ලෙස එකී සංස්ථාවේ කළමනාකරණ සභාව ඉල්ලීමක් කර ඇති හෙයින්, සහ එම ඉල්ලීමට ඉඩදීම මහජන හිතසුව පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2010 අංක 1 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත, එකී ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක, "ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත (සංස්ථාගත කිරීමේ) මණ්ඩලය පනත" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත" යන වචන ආදේශ කිරීමෙන් එකී ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතට කරනු ලබන පොදු සංශෝධන.

(2) යම් නියෝගයක, රීතියක, නිවේදනයක, දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත" යනුවෙන් වූ සෑම සඳහන් කිරීමක් ම, මෙම පනත බලාත්මක වන දිනයේ සිට "ශ්‍රී ලංකා කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත" ලෙස කියවා තේරුම් ගත යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ වෙනත් යම් නෛතික ලේඛනයක, දැන්වීමක, ගිවිසුමක හෝ වෙනත් යම් සන්නිවේදනයක "ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය" යනුවෙන් වූ සෑම සඳහන් කිරීමක් ම, මෙම පනත බලාත්මක වන දිනයේ සිට "ශ්‍රී ලංකා කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය" ලෙස කියවා තේරුම් ගත යුතු ය.

(4) "ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත" යටතේ ලියාපදිංචි වූ සංස්ථාවේ සියලුම සාමාජිකයන්, මෙම පනත බලාත්මක වන දිනයේ සිට "ශ්‍රී ලංකා කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත" යටතේ ලියාපදිංචි වූ සාමාජිකයන් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (අ) (ආ) (ඇ) (ඈ) (ඉ) (ඊ) (උ) (ඌ) (එ) (ඒ) (ඔ) (ඕ) (ක) (ග) (ච) (ඡ) (ට) සහ (ඩ) උපවගන්තිය පිළිවෙලින් එම වගන්තියේ (ඌ) (එ) (ඒ) (ඔ) (ඕ) (ක) (ග) (ච) (ඡ) (ට) (ඩ) (ණ) (ත) (ද) (න) (ප) (බ) සහ (ම) උපවගන්ති ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

(2) එහි (ඌ) ලෙස නැවත අක්ෂර යොදන ලද ඡේදයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් ඡේද එම අනුපිළිවෙලින්ම ඇතුළත් කිරීමෙන් :—

"(අ) ජාතික ආර්ථිකය වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත අංශය නගාසිටුවීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) කර්මාන්ත අංශය හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී රජය සහ අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වීම සහ ඒවාට සහාය ලබා දීම ;

(ඇ) කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත අංශයට සහාය වීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට පහසුකම් සැලසීම ;

(ඈ) කර්මාන්ත සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වෙළෙඳපල වෙත ප්‍රවේශය ලබාගැනීම සහ යටිතල පහසුකම් සහ වෙනත් අවශ්‍ය සහාය ලබා ගන්නා ආකාරය පිළිබඳව සාමාජිකයන්ට උපදෙස් ලබා දීම සහ සහාය වීම ;

(ඉ) සමුළු, වෙළෙඳ ප්‍රදර්ශන, ප්‍රදර්ශන සහ මිලදී ගන්නන් සහ අලෙවි කරන්නන්ගේ රැස්වීම් ආදිය සඳහා සහභාගි වීම සඳහා සාමාජිකයන්ට අනුග්‍රහය ලබා දීම ;

(ඊ) ව්‍යවසාය හැකියාව සහ කාර්මික කුසලතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සාමාජිකයන් සඳහා සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ;

(උ) පවත්නා නිෂ්පාදන ධාරිතාවය සහ පහසුකම් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවර්ධනය කිරීම, අපනයන අවශ්‍යතා සපුරාලන පරිදි නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීම සහ උප කොන්ත්‍රාත් හුවමාරුව පුළුල් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.